ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/9/16

චක්‍රලේඛ අංකය : පීඑස්/සීඑස්ඒ/චක්‍රලේඛ/22/2020

2020 ජුනි මස 18 වන දින

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,**

**රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් තනතුරුවල සේවය කළ නිලධාරීන් ගේ සේවය තවදුරටත් අඛණ්ඩව ලබා ගැනීම**

"රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන් ලෙස කටයුතු කළ නිලධාරීන් ගේ සේවය තවදුරටත් අඛණ්ඩව ලබා ගැනීම" යන මැයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක : අමප/20/894/201/022 හා 2020.06.02 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශයෙහි සඳහන් යෝජනා සඳහා 2020.06.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී පහත පරිදි අනුමැතිය ලබා දී ඇත.

1. 2020.03.02 දින දක්වා රාජ්‍ය අමාත්‍යාංශයන්හි ලේකම්වරුන් වශයෙන් කටයුතු කරන ලද නිලධාරීන් ගේ සේවය අඛණ්ඩව ලබා ගැනීමට පියවර ගනු ලැබ ඇති බැවින් ඔවුන් විසින් කරනු ලැබ ඇති කාර්යභාරයන් විධිමත් කිරීම සඳහාත්, ඔවුන් ගේ සේවාව තවදුරටත් ලබා ගැනීම සඳහාත්, 2020.03.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මහ මැතිවරණය පවත්වා නව අමාත්‍ය මණ්ඩලයක් පත්වන දිනය හෝ මෙම නිලධාරීන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයසට එළඹීමෙන් අනතුරුව සේවයෙන් විශ්‍රාම ගැනීමේ දිනය හෝ යන දෙකින් පළමුව එළඹෙන දිනය දක්වා,

    i. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ද එකඟතාවය මත වර්තමානයේ පවතින එක් එක් කැබිනට් අමාත්‍යාංශයන්හි අනුමත සේවක සංඛ්‍යාවට අතිරේකව, ඇමුණුම - 01 හි සඳහන් රාජ්‍ය අමාත්‍යාංශ සඳහා එම නිලධාරීන්ට පෞද්ගලික වනසේ, තාවකාලික පදනමින් අතිරේක ලේකම් තනතුරක් ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නියම කිරීමට,

    ii. ඉහත i හි පරිදි ඇති කරනු ලබන තනතුරු සඳහා ඇමුණුම - 01 හි නම් සඳහන් නිලධාරීන් 2020.03.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටීමට,

    iii. එම නිලධාරීන් සඳහා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ධූරයට හිමි වැටුප්, දීමනා හා අනෙකුත් වරප්‍රසාද ලබා දීමට,

2. 2020.03.02 දින දක්වා රාජ්‍ය අමාත්‍යාංශයන්හි ලේකම්වරුන් වශයෙන් කටයුතු කරන ලද ඇමුණුම - 02 හි සඳහන් නිලධාරීන් ගේ සේවය උක්ත කාර්යයන් සඳහා අඛණ්ඩව ලබා ගැනීමට පියවර ගනු ලැබ ඇති බැවින් ඔවුන් විසින් කරනු ලැබ ඇති කාර්යභාරයන් විධිමත් කිරීම සඳහා 2020.05.31 දින දක්වා එතෙක් ලබා ගත් වැටුප් හා දීමනා එලෙසම ලබා දීමටත්, 2020.05.31 දිනෙන් පසුව එම නිලධාරීන් ගේ සේවය අවසන් කිරීමට,

එබැවින්, උක්ත විධිවිධානයන්ට අනුකූලව ඉදිරි කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

තවද, උක්ත 1. (i) හා (ii) කාර්යයන් සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලය විමසා අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම මැනවි.

පී.බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

පිටපත් :
1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. විගණකාධිපති
4. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්
5. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
6. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඊ-තැපෑල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

ඇමුණුම - 01

| | නම | රාජ්‍ය අමාත්‍යාංශය |
|---|---|---|
| 1. | එස්.එච්. හරිස්චන්ද්‍ර මහතා | ලේකම්<br>ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය |
| 2. | එස්. සේනානායක මහතා | ලේකම්<br>වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 3. | එම්.සී.එල්. රුද්‍රිගු මහතා | ලේකම්<br>ඉඩම් හා ඉඩම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 4. | එස්.එච්.ජී.එන්.ඩී. අබේරත්න මහත්මිය | ලේකම්<br>ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 5. | බී.කේ.එස්. රවීන්ද්‍ර මහතා | ලේකම්<br>රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය |
| 6. | ඩී.ජී.ඩබ්ලිව්. වනිගසූරිය මහතා | ලේකම්<br>දුම්රිය සේවා රාජ්‍ය අමාත්‍යාංශය |
| 7. | ඩී.එස්. විජේසේකර මහත්මිය | ලේකම්<br>කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 8. | එල්.ඩී. සේනානායක මහත්මිය | ලේකම්<br>ජාත්‍යන්තර සහයෝගිතා රාජ්‍ය අමාත්‍යාංශයට |
| 9. | ආර්.එස්.එම්.වී. සෙනෙවිරත්න මහත්මිය | ලේකම්<br>දේශීය වෛද්‍ය සේවා රාජ්‍ය අමාත්‍යාංශය |
| 10. | ජී.එස්. පද්මලතා මහත්මිය | ලේකම්<br>කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය |
| 11. | කේ.එච්.ඩී.කේ. සමරකෝන් මහතා | ලේකම්<br>විදුලිබල රාජ්‍ය අමාත්‍යාංශය |
| 12. | එම්.ජී.බී.වී. බණ්ඩාරනායක මහතා | ලේකම්<br>තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය |
| 13. | එම්. දේවසුරේන්ද්‍ර මහතා | ලේකම්<br>බලශක්ති රාජ්‍ය අමාත්‍යාංශය |
| 14. | ජී.එච්.කේ.ජේ. චන්ද්‍රසිරි මහතා | ලේකම්<br>කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය |
| 15. | එස්.ජී. විජයබන්දු මහතා | ලේකම්<br>රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය |
| 16. | එස්. අරුමෙයිනායගම් මහතා | ලේකම්<br>ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 17. | එම්.එස්.එස්.එස්. ප්‍රනාන්දු මහතා | ලේකම්<br>සංචාරක ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය |
| 18. | සී.එස්. ලොකුහෙට්ටි මහතා | ලේකම්<br>තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය |
| 19. | ජී.සී. කරුණාරත්න මහත්මිය | ලේකම්<br>මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය |
| 20. | ජී. සේනානායක මහතා | ලේකම්<br>මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |

| | | |
|---|---|---|
| 21. | එම්.අයි. අමීර් මහතා | ලේකම්<br>අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය |
| 22. | ඩී.ඩී. මාතරආරච්චි මහතා | ලේකම්<br>සංවර්ධන බැංකු හා ණය යෝජනා රාජ්‍ය අමාත්‍යාංශය |
| 23. | ඊ.එම්.එම්.ආර්.කේ. ඒකනායක මහත්මිය | ලේකම්<br>ප්‍රවාහන සේවා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය |
| 24. | කේ.ඩබ්ලිව්.ටී.එන්. අමරතුංග මහත්මිය | ලේකම්<br>මහාමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 25. | ඒ.කේ.ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්.එන්.කේ. වීරසේකර මහත්මිය | ලේකම්<br>වනජීවී සම්පත් රාජ්‍ය අමාත්‍යාංශය |
| 26. | ඩබ්ලිව්.ඒ.ඩී.සී. රූපසිංහ මහත්මිය | ලේකම්<br>පරිසර රාජ්‍ය අමාත්‍යාංශය |
| 27. | කේ.ඒ.කේ.ආර්. ධර්මපාල මහතා | ලේකම්<br>ධීවර හා මිරිදිය මත්ස්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය |
| 28. | කේ.ජී.ඒ. අලවත්ත මහත්මිය | ලේකම්<br>සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය |
| 29. | ආර්. විජයලෙච්චුමී මහත්මිය | ලේකම්<br>ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 30. | අනුරාධ විජේකෝන් මහතා | ලේකම්<br>තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 31. | පී.එච්.ඒ. විමලවීර මහතා | ලේකම්<br>කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය |
| 32. | එස්.ටී. කොඩිකාර මහතා | ලේකම්<br>නිවාස රාජ්‍ය අමාත්‍යාංශය |
| 33. | බී.එන්.එම්. බාලසූරිය මහතා | ලේකම්<br>අභ්‍යන්තර වෙළඳ සහ පාරිභෝගික සුබසාධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 34. | රංජිත් චන්ද්‍රසේකර මහතා | ලේකම්<br>අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය |

ඇමුණුම - 02

| | නම | රාජ්‍ය අමාත්‍යාංශය |
|---|---|---|
| 1. | මහාචාර්ය රංජිත් දිසානායක මහතා | ලේකම්<br>නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 2. | මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර මහතා | ලේකම්<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය |